දුරකථන / தொலைபேசி / Telephone: 2698475, 2698490, 2698507
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2692913, 2694860
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / E-mail: postmaster@health.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No: PA/DDG/PHSII/3/COVID/Gen/2020 (Sub 6)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 12.05.2021

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

## මාධ්‍ය නිවේදනය

# අන්තර් පළාත් ගමනාගමනය සීමා කිරීම හා අවසරලත් පොදු ක්‍රියාකාරකම් කල යුතු ආකාරය (සංශෝධනය) - **2021.05.12** වන දින සිට **2021.05.31** වන දින දක්වා

රට තුල කොවිඩ් -19 රෝගීන් සංඛ්‍යාව වැඩිවන බැවින්, 2021 මැයි 12 වන දින සිට මැයි 31 දක්වා බලපැවැත්වෙන පරිදි පළාත් අතර ගමනාගමනය සීමා කරනු ලැබේ.

සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කරමින් පහත සඳහන් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් පළාත් සීමා අතර ගමන් කිරීමට කිරීමට අවසර ඇත.

1. සෞඛ්‍ය සේවා
2. පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව
3. අත්‍යවශ්‍ය නිල සංචාර සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන්
4. අත්‍යවශ්‍ය සැපයුම් බෙදාහරින්නන්
5. අත්‍යවශ්‍ය සේවා සපයන්නන් (උපයෝගිතා සේවා)
6. පවුලේ ආසන්නතම සාමාජිකයෙකුගේ අවමංගල්‍යක් සඳහා (තහවුරු කිරීම් අනිවාර්ය වේ)
7. විදේශගත වීම් / විදේශයක සිට පැමිණීම් හෝ ආනයන / අපනයන කටයුතු සඳහා අවශ්‍ය සේවාවන් (තහවුරු කිරීම් අනිවාර්ය වේ)

සුවිශේෂී අවස්ථාවන් හැරුණුකොට, හුදෙකලා කරන ලද පදිංචි අත්‍යවශ්‍ය සේවාවල නිරතවන්නන් තම රාජකාරී සඳහා වාර්තා කිරීම අනුමත නොකෙරේ.

දිනපතා රාත්‍රී 11 සිට අලුයම 4 දක්වා අත්‍යවශ්‍ය නොවන සියලුම සංචරණ වලට අවසර නොලැබේ.

2021 මැයි 01 දින නිකුත් කරන ලද "සංශෝධිත III වැනි අවදානම් මට්ටම මත පදනම්ව සිදු කල හැකි පොදු ක්‍රියාකාරකම් සහ කාර්යයන්" මාර්ගෝපදේශයන් මෙමඟින් අවලංගු වේ. ඒ අනුව, 2021 මැයි 12 වන දින සිට මැයි 31 දක්වා නැවත දැනුම් දෙන තුරු, පොදු ක්‍රියාකාරකම් කල යුතු ආකාරයෙහි සංශෝධනය ඇමුණුම I හි දක්වා ඇත.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**2021.05.12 වන දින සිට 2021.05.31 දක්වා අවසරලත් පොදු ක්‍රියාකාරකම් කල යුතු ආකාරය (සංශෝධනය)**

| # | ක්‍රියාකාරකම | විස්තරය |
|---|---|---|
| 1. | එක් නිවසකින්/ නවාතැනින් පිටවීමට අවසර දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව | එක් දිනයකදී නිවසකින් පිට වීමට අවසර දී ඇත්තේ එක පුද්ගලයකුට පමණි. එය තීරණය වනුයේ එම පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් අංකයෙහි අවසාන ඉලක්කම මතයි. අවසාන ඉලක්කම ඉරට්ටේ නම් ඉරට්ටේ දිනවලදීද එය ඔත්තේ අංකයක් නම් ඔත්තේ දිනවලදීද නිවසින් පිටව යා හැක. අවසාන අංකය බිංදුව නම් එය ඉරට්ටේ අංකයක් ලෙස සැලකේ. රාජකාරී කටයුතු සහ සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා මෙය අදාළ නොවේ. |
| 2. | පොදු ප්‍රවාහන සේවය | බස් රථයේ / දුම්රියේ ආසන ධාරිතාව දක්වා මගීන් ප්‍රවාහනය කිරීමට පමණක් අවසර ඇත |
| 3. | පෞද්ගලික කුලී රථ සේවා | කාර් සහ ත්‍රි රෝද රථ සඳහා උපරිම මගීන් සංඛ්‍යාව දෙකකට සීමා වන අතර වෙනත් වර්ගවල වාහන සඳහා එය ආසන ධාරිතාව දක්වා සීමා වේ. |
| 4. | උපයෝගිතා සේවා - විදුලිය, ජලය, විදුලි සංදේශ, ඉන්ධන පිරවුම්හල්, එල්පී ගෑස් ස්ථාන, මෝටර් රථ ගරාජ / ටයර් සේවා සහ තැපැල් / කුරියර් සේවා | අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සමඟ ක්‍රියා කිරීමට අවසර ඇති අතර හැකි සෑම විටම නිවසේ සිට වැඩ කිරීමට විකල්පයක් ලබා දිය යුතුය |
| 5. | රජයේ කාර්යාල | අවශ්‍ය අවම කාර්ය මණ්ඩලයක් යටතේ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛනයට අනුව ක්‍රියාත්මක විය යුතුය |
| 6. | පෞද්ගලික අංශයේ කාර්යාල | අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සමඟ ක්‍රියා කිරීමට අවසර ඇති අතර හැකි සෑම විටම නිවසේ සිට වැඩ කිරීමට විකල්පයක් ලබා දිය යුතුය |
| 7. | රැස්වීම් | ආයතනයේ සේවකයින් පමණක් උපරිමය පුද්ගලයින් 10කට සීමා කොට අත්‍යවශ්‍ය රැස්වීම් පැවැත්වීමට අවසර ඇත |
| 8. | වැඩමුළු / සම්මන්ත්‍රණ / සන්නාම දියත් කිරීම් | නැවත දැනුම්දෙනතුරු පැවැත්වීමට අවසර නැත |
| 9. | අපනයන අරමුණු කරගත් කර්මාන්ත (ඇඟලුම්, කෘෂිකාර්මික නිෂ්පාදන, යනාදිය) | ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ "ජෛව ආරක්ෂිත බුබුල" යන සංකල්පය යටතේ ක්‍රියාත්මක විය යුතුය. බාහිර පුද්ගලයින්ට ඇතුළුවීමට අවසර නැත. (ආරක්ෂිත ප්‍රවාහන ක්‍රමයක් / නවාතැන් පහසුකම් සේවකයින්ට ලබා දිය යුතුය) |
| 10. | සුපිරි වෙළඳසැල් | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් ඇතුල්කර ගත හැක. පුද්ගලයෙකුට ඇවිදීමට හැකි ඉඩ ප්‍රමාණය $1.5m^2$ ක් ප්‍රමාණවත් යැයි සැලකිය හැකිය. කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතනය තුලට ඇතුලත් කර ගත හැකි පුද්ගලයින් ගණන ආයතනයෙන් පිටත ප්‍රදර්ශනය කල යුතු ය. |

**2021.05.12 වන දින සිට 2021.05.31 දක්වා අවසරලත් පොදු ක්‍රියාකාරකම් කල යුතු ආකාරය (සංශෝධනය)**

| | | |
|---|---|---|
| 11. | සාප්පු සංකීර්ණ | සාප්පු සඳහා: වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් ඇතුල්කර ගත හැක. පුද්ගලයෙකුට ඇවිදීමට හැකි ඉඩ ප්‍රමාණය $1.5m^2$ ක් ප්‍රමාණවත් යැයි සැලකිය හැකිය. කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතනය තුලට ඇතුලත් කර ගත හැකි පුද්ගලයින් ගණන ආයතනයෙන් පිටත ප්‍රදර්ශනය කල යුතු ය.<br>සාප්පු සංකීර්ණයේ තුල / පිටත පුද්ගලයින් රැස්වීම් සහ විනෝදාස්වාදයන්ට අවසර නැත. |
| 12. | මූල්‍ය ආයතන (බැංකු, මූල්‍ය සමාගම්, උකස් මධ්‍යස්ථාන ආදිය) | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් ඇතුල්කර ගත හැක. පුද්ගලයෙකුට ඇවිදීමට හැකි ඉඩ ප්‍රමාණය $1.5m^2$ ක් ප්‍රමාණවත් යැයි සැලකිය හැකිය. කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතනය තුලට ඇතුලත් කර ගත හැකි පුද්ගලයින් ගණන ආයතනයෙන් පිටත ප්‍රදර්ශනය කල යුතු ය. |
| 13. | රෙදි පිළි සාප්පු | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් ඇතුල්කර ගත හැක. පුද්ගලයෙකුට ඇවිදීමට හැකි ඉඩ ප්‍රමාණය $1.5m^2$ ක් ප්‍රමාණවත් යැයි සැලකිය හැකිය. කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතනය තුලට ඇතුලත් කර ගත හැකි පුද්ගලයින් ගණන ආයතනයෙන් පිටත ප්‍රදර්ශනය කල යුතු ය. |
| 14. | කෘෂිකර්මාන්තය | සාමාන්‍ය ආකාරයෙන් ක්‍රියාත්මක විය හැකි අතර DReAM වලට තරයේ අනුගතව කටයුතු කල යුතුය. |
| 15. | සිල්ලර වෙළඳ සැල් / කඩ | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් ඇතුල්කර ගත හැක. පුද්ගලයෙකුට ඇවිදීමට හැකි ඉඩ ප්‍රමාණය $1.5m^2$ ක් ප්‍රමාණවත් යැයි සැලකිය හැකිය. කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතනය තුලට ඇතුලත් කර ගත හැකි පුද්ගලයින් ගණන ආයතනයෙන් පිටත ප්‍රදර්ශනය කල යුතු ය. |
| 16. | විවෘත වෙළඳපොල / පොළවල් (Open market/fairs) ආර්ථික මධ්‍යස්ථාන | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් සිටිය යුතු අතර කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු ය. |
| 17. | බේකරිය, වීදි වෙළෙන්දන්, බාබර් සහ රූපලාවණ්‍යාගාර, ගෘහ භාණ්ඩ, විදුලි උපකරණ, ඉදිකිරීමේ ද්‍රව්‍ය වෙළඳසැල්, රෙදි සේදීමේ ස්ථාන, මැහුම්කරුවන් සහ ඇඳුම් මසන්නන්, සන්නිවේදන වෙළඳසැල් / ඡායා පිටපත් සාප්පු | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට ගණුදෙනුකරුවන් ඇතුල්කර ගත හැක. පුද්ගලයෙකුට ඇවිදීමට හැකි ඉඩ ප්‍රමාණය $1.5m^2$ ක් ප්‍රමාණවත් යැයි සැලකිය හැකිය. කොවිඩ්-19 න් ආරක්ෂා වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතනය තුලට ඇතුලත් කර ගත හැකි පුද්ගලයින් ගණන ආයතනයෙන් පිටත ප්‍රදර්ශනය කල යුතු ය. |

**2021.05.12 වන දින සිට 2021.05.31 දක්වා අවසරලත් පොදු ක්‍රියාකාරකම් කල යුතු ආකාරය (සංශෝධනය)**

| | | |
|---|---|---|
| 18. | ජංගම වෙළෙන්දන් | අවසර ලබා දී ඇත. ලබා දී ඇති මාර්ගොපදේශයන්ට සහ DReAM වලට තරයේ අනුගතව කටයුතු කල යුතුය. |
| 19. | ඉන්ධන පිරවුම්හල් | අවසර ලබා දී ඇත. DReAM වලට තරයේ අනුගතව කටයුතු කල යුතුය. |
| 20. | ඉදිකිරීම් ස්ථාන | අවසර ලබා දී ඇත. DReAM වලට තරයේ අනුගතව කටයුතු කල යුතුය. |
| 21. | අධිකරණ | වරකට එම ස්ථානයේ සිටිය හැකි ඉඩ ප්‍රමාණයෙන් 25% ඉඩ ප්‍රමාණයක් පිරෙන ආකාරයට පුද්ගලයින් සිටිය යුතු අතර ලබා දී ඇති මාර්ගොපදේශයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| 22. | බන්ධනාගාර | අමුත්තන්ට පැමිණීමට අවසර නැත. |
| 23. | සෞඛ්‍ය අංශ - රජයේ රෝහල්, පුද්ගලික රෝහල්, ෆාමසි, රසායනාගාර, වෛද්‍ය සේවා ඇතුළුව | දී ඇති මාර්ගෝපදේශවලට අනුකූලව, අවශ්‍ය කාර්යමණ්ඩලයක් යටතේ සේවා අවශ්‍යතාවය අඛණ්ඩව සැපයිය යුතුය. |
| 24. | දිවාසුරැකුම් මධ්‍යස්ථාන | නැවත දැනුම්දෙනතුරු වසා ඇත. |
| 25. | පෙර පාසල් | නැවත දැනුම්දෙනතුරු වසා ඇත. |
| 26. | පාසල් | නැවත දැනුම්දෙනතුරු වසා ඇත. |
| 27. | විශ්ව විද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතන | නැවත දැනුම්දෙනතුරු වසා ඇත. |
| 28. | උපකාරක පන්ති | නැවත දැනුම්දෙනතුරු වසා ඇත. |
| 29. | මංගල උත්සව | නැවත දැනුම්දෙනතුරු පැවැත්වීමට අවසර නැත. විවාහ ලියාපදිංචි කිරීම් පමණක් ළඟම ඥාතීන් උපරිම 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදු කල හැක. |
| 30. | අවමංගල්‍ය උත්සව (කොවිඩ්-19 අසාදනය නොවූ මෘතදේහ සඳහා) | මෘතදේහය රෝහලෙන් / මරණ පරීක්ෂක මුදා හැර පැය 24 ක් ඇතුළත අවමංගල්‍ය උත්සවය පැවැත්විය යුතුය. ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව, පැමිණෙන පුද්ගලයින් ප්‍රමාණය අවම කිරීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගනිමින් වරකට උපරිම පුද්ගලයින් 15කට සීමාකොට මෙය පැවැත්විය යුතුය. |
| 31. | උත්සව, සාද, එක්රැස්වීම් (ගෘහස්ථ / එළිමහන්) (නිවෙස් තුල පැවැත්වෙන සුළු සාද ඇතුළුව) | පැවැත්වීමට අවසර නැත. |
| 32. | පන්සල්, පල්ලි, කෝවිල් වැනි පූජනීය ස්ථාන | සාමූහික ක්‍රියාකාරකම් හෝ රැස්වීම් පැවැත්වීමට අවසර නැත. |
| 33. | බෝඩිං නිවාස | ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව පූර්ණ ධාරිතාවයෙන් සිටිය හැකිය. කෙසේ වෙතත්, නව පුද්ගලයින්ට නවාතැන් ලබා නොදිය යුතුය. |
| 34. | ව්‍යායාම ශාලා / ගෘහස්ථ ක්‍රීඩා ශාලා | 2021 මැයි 31 දක්වා වසා ඇත. |

**2021.05.12 වන දින සිට 2021.05.31 දක්වා අවසරලත් පොදු ක්‍රියාකාරකම් කල යුතු ආකාරය (සංශෝධනය)**

| | | |
|---|---|---|
| 35. | ඇවිදින මංතීරු | ඇවිදීමට පමණක් විවෘත වන අතර මහජනයා එක්රැස්වීමට අවසර නැත. |
| 36. | සිනමා ශාලා | වසා ඇත. |
| 37. | ළමා උද්‍යාන | වසා ඇත. |
| 38. | සැණකෙළි, සංගීත සංදර්ශන, වෙරළ තීර සාද | වසා ඇත. |
| 39. | පිහිනුම් තටාක | වසා ඇත. |
| 40. | වෙරළ | මහජනයා එක්රැස්වීමට අවසර නැත. |
| 41. | අවන්හල් (පරිභෝජනය කරන) Restaurant (dining in) | ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව ඕනෑම වෙලාවක මුළු ආසන ධාරිතාවෙන් උපරිම 25% පිරෙන ආකාරයට ගනුදෙනුකරුවන් ඇතුලත් කර ගත හැක. සමූහ වශයෙන් ආහාර ගැනීම උපරිම පුද්ලයින් 8 දෙනෙකුට පමණක් සීමා කල යුතුය. |
| 42. | අවන්හල් (රැගෙන යන) Restaurant (take away/delivery) | සාමාන්‍ය ආකාරයෙන් ක්‍රියාත්මක විය හැකි අතර DReAM වලට තරයේ අනුගතව කටයුතු කල යුතුය. |
| 43. | මද්‍යසාර අලෙවිසල් | උදෑසන 10.00 සිට රාත්‍රී 6.00 දක්වා පමණක් විවෘතව තැබීමට අවසර ඇත. DReAM වලට තරයේ අනුගතව ක්‍රියාත්මක විය යුතුය. |
| 44. | පබ් (Pubs and bars) | වසා ඇත. |
| 45. | කැසිනෝ, රාත්‍රී සමාජශාලා | වසා ඇත. |
| 46. | ඔට්ටු මධ්‍යස්ථාන | වසා ඇත. |
| 47. | ස්පා (spa) | වසා ඇත. |
| 48. | හෝටල්, විවේකාගාර (Hotels, rest houses and guest houses) | ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව ඕනෑම වෙලාවක මුළු ධාරිතාවෙන් උපරිම 25% පිරෙන ආකාරයට ගනුදෙනුකරුවන් ඇතුලත් කර ගත හැක. |

***DReAM** (පුද්ගල දුරස්ථභාවය පවත්වා ගැනීම, ශ්වසන ආචාර විධි පවත්වා ගැනීම, දෑත් සනීපාරක්ෂාව සහ මුහුණු ආවරණ පැළඳීම)

මාර්ගෝපදේශ සඳහා වෙබ් දිගුව:
http://www.health.gov.lk/moh_final/english/article_read_more.php?id=938